**ශීර්ෂය - 16 පාර්ලිමේන්තුව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

---

1.1 **තත්ත්වාගණනය කළ මතය**

---

පාර්ලිමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූලි 05 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 05 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුලත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බවද,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------------

**1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

-------------------------

**(අ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------------------------- | ----------- |
| (i) | 2013 ජනවාරි 24 දිනැති අංක එස්ඒ/ඒඑස්/ඒඒ/චක්‍රලේඛ දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3 ඡේදයට පටහැනිව, පාර්ලිමේන්තුව සතු මාදිවල නිවාස සංකීර්ණය, නුවරඑළියේ සෙන්පති මැදුර සහ අනුරාධපුර මෙත් සෙවනට අයත් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි. | පාර්ලිමේන්තුවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල වත්කම් තක්සේරු කර දෙන ලෙසට තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලා ඇති අතර සිහි කැඳවීම් ලිපි ගණනාවක් ද යවා ඇති නමුත් තක්සේරු වාර්තා ලබාදීමට දෙපාර්තමේන්තුව මේ දක්වාත් අපොහොසත් වී ඇති බව හා ඉදිරියේදී මේ සම්බන්ධව තක්සේරු දෙපාර්තමේන්තුව වෙත නැවතත් සිහි කැඳවීමේ ලිපියක් යොමු කරනු ලබන බව. | චක්‍රලේඛ ප්‍රකාරව ජංගම නොවන වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. |
| **(ii)** | පරිත්‍යාග ලෙස ලැබුණු රු.52,217,264 ක වත්කම් ගිණුම් ගත කර නොතිබුණි. | පරිත්‍යාග ලෙස ලැබුණු වත්කම්වල වටිනාකම 2021 වසර තුළ ගිණුම් ගත කිරීමට කටයුතු යොදනු ලබන බව | පරිත්‍යාග ලෙස ලද වත්කම් අප්‍රමාදව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 1.6.2 අත්තිකාරම් ගිණුම් ශේෂ

-----------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අත්තිකාරම් පාලන ගිණුමේ ශේෂය හා කේවල ශේෂ අතර සමාලෝචිත වර්ෂයේ ආරම්භක හා අවසාන ශේෂවල රු.498,260 ක හා රු.125,843 ක වෙනසක් පැවතුණි. | අත්තිකාරම් පාලන ගිණුමෙහි ශේෂය සහ කේවල ණය වර්ගීකරණ සාරාංශයේ එකතුව අතර 2019 දෙසැම්බර් 31 දිනට පැවති රු. 498,260 ක වෙනස 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී රු.125,843 ක් දක්වා අඩු කර ගැනීමට හැකි වු බව හා මේ වන විට එම වෙනසද රු.62,217.60 ක් දක්වා අඩුකර ගැනීමට හැකි වූ බව | ගිණුම් අතර පවතින වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | බැරකම් ලේඛනයේ සහ භාණ්ඩාගාර බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ ඇතුලත් නොවූ රු.3,199,200 ක බැරකම් 2021 වර්ෂයේ නිරවුල් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාව වන විට මූල්‍ය අංශයට විස්තර සොයා ගැනීමට නොහැකි වූ බැඳීම් හා බැරකම්වලට අදාල අගයන් බැරකම් ප්‍රකාශනයෙහි ඇතුළත් වී නොමැති බැවින් මෙම අඩුපාඩුව සිදුවී ඇති බව හා ඉදිරියේදී මෙම තත්ත්වය අවම වන අයුරින් කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දුන් බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | මුදල් රෙගුලාසි 94(2) ප්‍රකාරව, සැපයුම් හා සේවා බැරකම්වලට අදාල නොවන රු.194,831 ක බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | වර්ගීකරණ දෝෂයක් නිසා මෙම අඩුපාඩුව සිදුවී ඇති අතර 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මෙවැනි අඩුපාඩු ඇති නොවන අයුරින් කටයුතු කරන ලෙසට උපදෙස් ලබා දුන් බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම් සටහන් කළ යුතුය. |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩ තහනම් කළ, සේවය හැර ගිය හා වෙනත් නිලධාරීන්ගෙන් අයවියයුතු වර්ෂ 05 ඉක්මවූ ශේෂ එකතුව රු.941,450 ක් විය. | ණය ශේෂයන් වලින්, රු.232,362 ක ණය ශේෂ තුල ඇතුලත් නිලධාරියාගෙන් අයවිය යුතු රු.100,336 ක් මේ වන විට අයකර ගෙන ඇති බව, තවදුරටත් අයකර ගතයුතු වටිනාකම රු.132,026 ක් හා රු.310,386.67 ක ණය ශේෂයෙන් අයකර ගැනීමට නොහැකි බව, තහවුරු කර ගත් රු.25,000 ට වඩා අඩු ණය ශේෂ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතියෙන් එකතුව රු. 36,063.33 ක ණය කපා හැර ඇති බව හා රු. 25,000 ට වැඩි සේවය හැර ගිය නිලධාරීන් සහ සේවයෙන් පහකර ඇති නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.333,136.34 ක ණය ශේෂ කපා හැරීමට රාජ්‍ය මුදල් අධ්‍යක්‍ෂ ජනරාල්ගේ අංක PFD/RED/WO/2020/30 සහ 2021 ජුනි 08 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලබා දී ඇති බව, තවද වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.398,701.85 ක මුදල නීතිමය කටයුතු අවසන්ව නොමැති බැවින් හිඟ ණය ශේෂ අයකර ගැනීමට මෙතෙක් නොහැකි වී ඇති බව. | අය නොවී පවතින ණය ශේෂ අයකර ගැනීමට කඩිනම්ව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අංක 262/2017 හා 2017 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛයේ 4 වන ඡේදයේ උපදෙස් නොසලකා 2018 හා 2019 වර්ෂවල විශ්‍රාමික නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.162,024 ක් අත්තිකාරම් ගිණුමේ දක්වා තිබුණි. | 2018 වර්ෂයට අදාලව එක් නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.7500 ක උත්සව අත්තිකාරම් ගෙවන ලෙස ලිඛිතව සහ දුරකථන මාර්ගයෙන් වාචිකවද දැනුවත් කර ඇති බව හා 2021.05.05 දින නැවත දුරකථනයෙන් දැනුවත් කර ඇති අතර හිඟ මුදල අයකර ගැනීමට තවදුරටත් උත්සාහ කරනු ලැබේ. එක් නිලධාරිණියකගෙන් 2019 වර්ෂයට අදාලව අයවිය යුතු රු.154,524 ක ණය ශේෂයන් ඒ මහත්මිය විදේශ දූත මණ්ඩල සේවය සඳහා 2008.05.01 දින සිට 2011.09.09 දින දක්වා අනුයුක්තව සේවය කර ඇති කාලය සඳහා වූ විශ්‍රාම | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | වැටුප් දායක මුදල් ගෙවීම සම්බන්ධව විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් තහවුරුවක් ලබා ගැනීම් සහ අදාල තහවුරුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබාදුන් පසුව විශ්‍රාම පාරිතෝෂිකයෙන් මෙම ණය මුදල අයකර ගැනීමට කටයුතු කරන බව. | |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 සැලසුම් කිරීම**

-----------------

**ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | ------------------------------------ | ----------- |
| ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් රු.5,018,000 ක ඇස්තමේන්තුගත වියදමක් සහිත දේශීය හා විදේශීය පුහුණු සඳහා ප්‍රතිපාදන රු.2,000,000 ක් පමණක් ලැබී තිබීම හේතුවෙන්, සැලසුම් සාර්ථක කර ගැනීමට නොහැකි වී තිබුණි. | එකඟ වන අතර වාර්ෂික පුහුණු සැලැස්ම සාර්ථක කර ගැනීම පිණිස අනුමත මුදල් ප්‍රතිපාදන සීමාවට හැකිතාක් ගැලපෙන අයුරින් සකස් කිරීමට උපදෙස් ලබා දුන් බව. | ඇස්තමේන්තු නිවැරදි හා ප්‍රායෝගිකව සකස් කළ යුතු වීම. |

**3.2 අවිධිමත් ගනුදෙනු**

---------------------

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ----------------------- | ----------------------------------- | -------------- |
| 2018 පෙබරවාරි 15 දිනැති අංක 01/2018 දරන, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 1.2 ඡේදය හා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් පාර්ලිමේන්තු මහලේකම් වෙත නිකුත් කර ඇති, අංක TIP/SS/01/84 හා 2019 අප්‍රේල් 25 දිනැති ලිපියේ උපදෙස් නොසලකා, ජ්‍යෙෂ්ඨ මට්ටමේ | මෑතකදී පාර්ලිමේන්තුවේ පුස්තකාලයාධිපති වෙත සහනදායී මෝටර් වාහන බලපත්‍රයක් නිකුත් කිරීමේ ඇති හැකියාව පිළිබඳව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂවරයාගෙන් කරන ලද කරුණු පැහැදිලි කර ගැනීමේදී ඔහු විසින් 2015.02.05 දාතම | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| විධායක තනතුරක වසර හයක සක්‍රීය සේවා කාලයක් නොමැති පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකුට සහනදායී මෝටර් වාහන බලපත්‍ර නිකුත් කර තිබුණි. | යටතේ ඔහුගේ පූර්වගාමියා විසින් ලිඛිතව ලබා දී තිබූ අනුමැතියට අනුකූල නොවන නිරීක්‍ෂණයක් ඉදිරිපත් කොට තිබුණි. එමගින් ඔහුගේ පූර්වගාමියා විසින් දී තිබූ තීරණය ඍජුව නිශේධනය කිරීමක් සිදුකර නොතිබූ බැවින් එවන් තත්ත්වයක් තුල නිලධාරීන් භුක්ති විඳිමින් තිබූ වරප්‍රසාදයක් පදනමකින් තොරව ඉවත් කිරීම සුදුසු නොවේ. එබැවින් හා එය හුදෙක් නිරීක්‍ෂණය කිරීමක් ලෙස පමණක් සටහන් කර තිබූ බැවින් 2015 වසරේ සිටම ක්‍රියාත්මක කළ ක්‍රමවේදය මේ දක්වා අනුමනය කරන ලදි. විගණන විමසුමෙන් පසුව සහනදායී මෝටර් වාහන බලපත්‍ර නිකුත් කිරීම අත්හිටුවා ඇති අතර මෙම ගැටළුකාරී තත්ත්වය පිලිබඳව මුදල් අමාත්‍යවරයාගේත් අදාල අනෙකුත් නිලධාරීන්ගේත් අවධානයට ලක් කිරීමට හා උපදෙස් ලබා ගැනීමට නුදුරේදීම සාකච්ඡාවක් සංවිධානය කිරීමට සැලසුම් සකස් කොට ඇත. | |

## 4. මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණ** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 153 න් 08 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. | 2020 දෙසැම්බර් 31 වැනි දිනට පාර්ලිමේන්තුවේ මහලේකම්ගේ කාර්ය මණ්ඩලයේ අනුමත 984 ක්, තථ්‍ය 831 ක් හා පුරප්පාඩු 153 ක සේවක සංඛ්‍යාවක් පවතින බව. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වීම. |